# 1

# පධානඝර, මහාවිහාර සැලසුම තුළ වර්ධනය වූ ආරාම විශේෂයක් ද? (මහා විහාර මයුර පිරිවෙන හා ජේතවන මොනර මාලිගයේ අතීත උපයෝගීතාව ඇසුරින් සිදු කෙරෙන විමර්ශනයක්)

**රේණුකා ශ්‍යාමලී ගුණරත්න**

---

**ප්‍රවිෂ්ටය**

පුරාණයෙහි භික්ෂූන් සෙනසුන් සඳහා භාවිත කළ ස්ථාන "පිරිවෙන" වශයෙන් හැඳින් වූ අතර භික්ෂූන් වහන්සේලා සෙනසුන් සඳහා පරිභෝග කළ ස්ථානය, ආවාසය හෝ පිරිවෙන නම් විය. පුරාණයේ භික්ෂූන් වැඩවාසය කළ ස්ථාන පිරිවෙන් වශයෙන් හඳුන්වා ඇති බවට සාධක වංසකතා ආශ්‍රිතව ද හඳුනාගත හැකිය. අනුරාධපුර මහා විහාරයේ මෙ වැනි පිරිවෙන් හා ප්‍රාසාද 364ක් තිබූ බව නිකාය සංග්‍රහයේ (නිස. 14)දැක්වෙන අතර මහාවංසය, විසුද්ධි මාර්ගය, රසවාහිනිය වැනි මූලාශ්‍රය ග්‍රන්ථයන්හි ද රජවරුන් විසින් පුරාණ විහාර ආශ්‍රිත පිරිවෙන් ඉදි කිරීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ ආකාරය දැක්වෙන තොරතුරු සඳහන් වී තිබේ.

මෙම පර්යේෂණයේ දී සාකච්ඡාවට ලක් කරනුයේ අනුරාධපුරය මූලික කර ගනිමින් ආරම්භ ව වර්ධනය වූ පධානඝර විහාර පිළිබඳව ය. පධානඝර විහාරවල ආරම්භය හා විකාශය පිළිබඳ ව විමසීමේ දී පධානඝර යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද යන්න විමසා බැලීම වැදගත් වේ. පධානඝර යන වචනයෙහි වචනාර්ථය විග්‍රහ කිරීමේ දී සුමංගල ශබ්දකෝෂය එය විස්තර කර ඇත්තේ පධාන් යනුවෙනි. කෙලෙස් තැවීම හෝ කෙලෙස් තවන වීර්ය යන්න අර්ථවත් කරමින් වීර්ය වඩන තවුස් දම් පුරණ යෝගීන් වෙසෙන භූමිය පධන් භූමිය ලෙසට එහි වැඩිදුර විස්තර

කර ඇත (ශ්‍රී.සු.ශ.කෝ. 553-549). මූලාශ්‍රයන් හි සඳහන් වන කරුණු කෙරෙහි අවධානය යොමු කර මේ පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී පධානඝර හැඳින්වීමට පියන්ගල් හා පතන්ගල යන පර්යාය නාමයන් හඳුනාගත හැකි වේ. යථෝක්ත වචනවල නිරුක්ති විග්‍රහ කිරීමේ දී පධාන > පදන > පියන් ලෙස ද, ගල යන්න ශෛල > සිලා > සල් > හල් > ගල් ලෙස නිෂ්පන්න වී ඇති බව පැහැදිලි වේ (කෞෂල්‍යාය; හෙට්ටිආරච්චි 2012:80-91). දම්පියා අටුවා ගැටපදයෙහි පධාන වශයෙන් බවුන් වැඩීම සඳහා සාදනු ලබන ගෘහය පධානඝර ලෙස සඳහන්වන බව කෞෂල්‍යාය හා හෙට්ටිආරච්චි පෙන්වා දී ඇත (එම).

පධානඝරවල ආරම්භය හා විකාශය පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී මූලාශ්‍රය තොරතුරු ද අතිශයින් වැදගත් වේ. භික්ෂූන් වහන්සේලාගේ සේනාසන පිළිබඳ විස්තර කරන රාහුල හිමි එම සේනාසන පිහිටි ගොඩනැගිලි අතර වැදගත් ගෘහයක් ලෙස භාවනා ගෘහය සඳහන්කර තිබේ (රාහුල 1989:138). උන්වහන්සේ විස්තර කර ඇති ආකාරයට අනුරාධපුර මහාවිහාරවල වාසය කළ භික්ෂූන් වහන්සේලා භේදභින්න වී යාමෙන් නිකායන් බිහි වී ඇත (*මව.* xli:97, xliv:131). මෙසේ බිහි වූ නිකාය කිහිපය අතර ධම්මරුචික සහ සාගලික යන නිකායන් හඳුනාගත හැකි ය. මෙසේ ඇතිවන නිකාය භේදය නිසා ක්‍රි.පූ. පළමු වැනි සියවස අගභාගයේ දී ධම්මකථික හා පාංසුකූලික යනුවෙන් භික්ෂු දෙකොටසක් පිළිබඳ ව සඳහන්වන අතර මේ දෙක ම එකම කොටසකට අයත් වන බව රාහුල හිමි අර්ථකතනය කර ඇත්තේ මෙපරිද්දෙනි.

- ධම්මකථික - ආචාර්යවරුන් ලෙස කටයුතු කළ උගත් භික්ෂූන්
- පාංශුකූලික - කඩමල්ලෙන් මැසූ සිවුරු පමණක් භාවිත කරන භික්ෂූන්

මෙම පිරිස ද නැවත කොටස් තුනකට බෙදා ඇත.

i. සොහොන් බිම්වලින් අහුලාගත් කඩමාල්ලෙන් සිවුරු පොරවන පිරිස
ii. භික්ෂූන්ගේ පරිභොජනය පිණිස ගිහියන් තැනින් තැන තබාගිය සිවුරු පිළිගත් පිරිස
iii. ගිහියන් භික්ෂූන් පාමුල තබා ගිය සිවුරු පෙරවූ පිරිස (රාහුල 1989:203)

මෙසේ වෙන වෙන ම නිකාය පහළ වූ පසු එක් එක් නිකායෙහි ඒ නිකායට ම අයත් පාංශුකූලිකයන් වාසයකර ඇත. මහාවිහාරයට ද අභයගිරියට ද අයත් පාංශුකූලිකයෝ ද වූ බව මූලාශ්‍රය කරුණුවලින් පැහැදිලි වන අතර ඒ අනුව පධානඝරවල බිහිවීම මේ ආකාරයෙන් හඳුනාගත හැකි ය. මහාවංසයේ සහ සෙල්ලිපිවල සඳහන් වී ඇති ආකාරයට පධානඝර පිළිබඳ ව තොරතුරු මෙසේ සඳහන් වී තිබේ.

- ක්‍රි.ව. 65-109 රජ කළ වසභ රජු පිහිට වූ පෙරුමියන්කුලම ගිරි ලිපියේ සුදසන පතන ගලහිස යනුවෙන් දැක් වේ (*Ez*.vol. i:66, *Ez* .vol. ii:70)
- ක්‍රි.ව. 898-914 රජ කළiv වැනි කාශ්‍යප රජුගේ මන්නාරම් කච්චේරි ටැම් ලිපියේ මහ වෙහෙර. බහදුරගේ පියන් ගල ද බැඳ (*Ez*.vol.ii:107). යනුවෙන් ද
- ක්‍රි.ව. 980-990 රජ කළ v වැනි කාශ්‍යප රජුගේ මැදිරිගිරි ටැම් ලිපියේ මැඩිලිගිරි ඇත් වෙහෙර්පියන්ගලැ (*Ez*. vol. i:29) යනුවෙන් ද
- ක්‍රි.ව. 952-972 රජ කළ iv වැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ සහල් එකඩ මනා දෙපතක් ඉසා පියන්ගල් පෙරෙවැලියක් කුටි දෙපසක (*Ez*. vol.i: 95) යනුවෙන් ද
- ක්‍රි.ව. 914-923 රජ කළ v වැනි කාශ්‍යප රජුගේ අනුරාධපුර පුවරු ලිපියේ රජ මහ වෙහෙර්හි ඉසාපිරිවෙන්හි ඉසා පියන්ගල් ඉසා (*Ez*. vol.i:52-53) යනුවෙන් ද
- සංගිලි කනදරාවේ ලිපියක පියන්ගල (*Ez*.vol. iii:106) යනුවෙන් ද
- ක්‍රි.ව. 1153-1186 රජ කළ I වැනි පරාක්‍රමබාහු රජුගේ ලිපියක එහි නැවතී සිටි භික්ෂුවක් ගැන හා පධානඝරයක් ගැන විස්තර වේ (*Ez*. vol.ii:277)

මහාවංසයේ ද පධානඝර සම්බන්ධ ව මෙසේ සඳහන් වී ඇත. ක්‍රිස්තු වර්ෂ 711-717 රජ කළ V වැනි අග්බෝ තමා හැඳි අගනා සළුපිළි පවා පාංශුකූලික භික්ෂූන්ට සිවුරු හැටියට දුන් බව සඳහන් වී ඇත (*මව*. xlviii:16). එසේ ම ථූපාරාමයෙහි ප්‍රාසාදයක් ඉදිකොට පාංශුකූලිකාංගය රක්‍ෂා කරන භික්ෂූන්ට දිනි (*මව*. xlv :66) යනුවෙන් සඳහන් වී ඇත.

**විමර්ශනය**

මෙම පර්යේෂණ තුළින් ශ්‍රී මහා බෝධියට වයඹ දෙසින් පිහිටි මහා විහාර මයූර පිරිවෙන නමින් හැඳින්වෙන්නා වූ ගොඩනැගිල්ල හා ජේතවනාරාම ස්තූපයට ගිණිකොණ දෙසින් පිහිටි ජේතවනාරාම මොනර මාළිගය නමින් හඳුන්වන පුරාණ ස්මාරක දෙක පුරාණයේ දී පධානඝර වශයෙන් භාවිත වූයේ දැයි විමර්ශනය කරනු ලැබේ. මහා විහාර මයූර පිරිවෙන ක්‍රිස්තු වර්ෂ 340-368 රජ පැමිණි බුද්ධදාස රජු ඉදිකළ බව මහාවංසයේ සඳහන් වී තිබේ. මහාවංස කතුවරයා එය විස්තර කර ඇත්තේ මෙසේය "පස්විසි රියන් පහයකින් හොබනා මොනර පිරිවෙන මහාවිහාරයෙහි කරවීය. සමනය, ගොළ පාණුව යන ගම් දෙක ඊටපුද කළේය" (*මව*. xxxvii :172-173). මයූර පිරිවෙන මෙසේ ඉදිකිරීමෙන් පසු ව ධාතුසේන රජු ක්‍රිස්තු වර්ෂ 455-477 "මහා විහාරයේ පස් විසි රියන් මොනර පිරිවෙණ

මූලශුද්ධියෙන් ශුද්ධ කරවා එක් විසිරියන් පමණ කොට කරවා" (*මව.* xxxviii:52-53). ඇත. ක්‍රිස්තු වර්ෂ 573-575 රජ පැමිණි මහානාග රජු "ගුණයෙහි ඇලුණු රජු ධීරමාතික වාරය ද මහාවෙහෙරටම දින. මොනර පිරිවෙන ද නවකම් කළේය" (*මව.* xl:100-101) යනුවෙන් මහා විහාරයේ අලුත්වැඩියා කටයුතු පිළිබඳව සඳහන් වේ. දාඨෝපතිස්ස රජු විසින් මොනර පිරිවෙනට කසගම පූජා කළ බව ද (*මව.* xliii: 27) සඳහන් වේ. ක්‍රිස්තු වර්ෂ 10 වැනි සියවසට අයත් මන්නාරම් කච්චේරියේ ඇති ශිලාලේඛනයේ මහා විහාරයේ පැවති බහදුරුසෙන් නම් පධානඝරයක් පිළිබඳ ව සඳහන්වේ (*Ez* vol. iii.:100-113). ක්‍රිස්තු වර්ෂ 10 වැනි සියවසේ රචනා කරන ලද පාලි මහා බෝධිවංසයේ ද මයුර පිරිවෙන මොනරපාසාද පධානඝරං මොරවා පියංගල් වෙහෙර ලෙස දක්වා ඇත (*මබෝවගැප.* :142). මේ ආකාරයට මූලාශ්‍රයන්හි මහාවිහාර මයුර පිරිවෙන පිළිබඳ මූලාශ්‍රයන් හි විශේෂ ලෙස සඳහන් වීමෙන් ගොඩනැගිල්ලේ උපයෝගිතාවේ වැදගත් බව සහ එහි භාරකාරත්වයේ විශේෂත්වය මත රාජ්‍යය අනුග්‍රහය ලැබී ඇති බව ද පෙනේ.

වර්තමානයේ මොනර මාළිගය නමින් හැඳින්වෙන්නා වූ ජේතවන පුරාවිද්‍යා භූමියේ ඇති ගොඩනැගිල්ලේ භෞතික ස්වරූපය අනුව මහා විහාර මයුර පිරිවෙනට සමීප සබඳතාවක් ඇති බව වාස්තුවිද්‍යාත්මක සැලැස්ම අධ්‍යයනයෙන් හඳුනාගත හැකි විය. එම ගොඩනැගිල්ලේ භෞතික සාධක පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී ජේතවන මොනර මාළිගය නැමති ගොඩනැගිල්ලේ කුළුණු පිහිටා ඇති ස්වරූපය හා මහා විහාරයේ මයුර පිරිවෙන නැමති ගොඩනැගිල්ල අතර සමානතාවන් තිබේ. මහා විහාර මයුර පිරිවෙනෙහි කුළුණු 23ක් ද ජේතවන මොනර මාළිගයේ කුළුණු 20ක් ද තිබී ඇති බව එච්.සී.පී. බෙල්ගේ සැලසුම් පරීක්ෂා කිරීමේ දී පෙනේ (ASCAR 1983). සිංහල සැරසිලිවලට අයත් ගිනි දැල්ල, ලියවැල් මල් මෝස්තර මගින් පුරාණ සැරසිලි ක්‍රම පෙන්නුම් කරන බැව් පැවසේ (මද්දුමගේ 1981:130-137). මෙම ගොඩනැගිලි දෙකෙහි ම තිබෙන වාමන රූ මෙරට කලා නිර්මාණවල නොයෙකුත් ස්ථානයන්හි ද දැකිය හැකිය. ලෝවාමහාපාය, රුවන්වැලිය, ථූපාරාමය ආදි ස්ථානවල පිහිටි ශෛලමය කණු හිස්වල මෙයට සමාන සැරසිලි තිබේ (ලක්දුසිංහ 1988:388). තිවංක ඉරියව්වෙන් යුක්තව ඔටුන්නක් සහිත නාග පෙන සහිත මානව රූ සහිත මුරගල්, ගොඩනැගිලි දෙකෙහිම සමාන ලක්ෂණ සහිත ව දැකිය හැකි අතර ද්වාරවල ඇති මෙම කැටයම් මුරගල් විකාශනයේ උච්චතම අවස්ථාවක් ලෙස ද හඳුනාගෙන ඇත (වික්‍රමගමගේ 1995:26-27). කොරවක්ගල්වල ඇති මොල්ලිය සහිත මකර රුව පවා ගොඩනැගිලි දෙකෙහි ම සමානත්වයක් පෙන්නුම් කරන අතර, ගොඩනැගිලි දෙකෙහිම පිටුපස බිත්තියේ වම්පස මුල්ලේ ගල් පුවරු අතුරා ඇති කොටස මහල් ගොඩනැගිල්ලක් ලෙස පැවති බවට ද සාධක සපයයි. මෙහි කුළුණු හිස්වලට ඉහළින් කුඩුම්බියක් දැක ගත

නොහැකි බැවින් ගොඩනැගිලි දෙකෙහිම කුළුණු මත දැවයෙන් කළ බාල්ක රඳවා ඉන් ඉහල කොටස වර්තමාන සොල්දර ආකාරයෙන් නිර්මාණය කර තිබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකිය. මයුර පිරිවෙන නමින් හැඳින්වෙන ගොඩනැගිල්ල පිළිබඳව සඳහන් කරන කේව් අනුරාධපුරයේ ඇති සියලු ගොඩනැගිලි අතරින් අලංකාරම ගොඩනැගිල්ල මෙය බවත්, එහි පිටත දැකිය හැකි වූ අලංකාර කර්මාන්ත නිසාම ඊට එම නාමය ලැබී ඇති බවත් සඳහන් කර තිබේ (කේව් 1999:78-79). මහාවංසය වැනි වංසකතා වල මයුර පිරිවෙන යනුවෙන් විශේෂ නමකින් යුත් ගොඩනැගිල්ලක් හඳුන්වා දී තිබීම හා එය භාවිත කිරීම කුමන උපයෝගීතාවක් මත සිදු වූවා දැයි විමර්ශනය කිරීම වැදගත් වේ. මහාවිහාර මයුර පිරිවෙනේ සහ ජේතවන මොනර මාළිගයේ කැටයම් සහ ගොඩනැගිලි අලංකරණ වල භෞතික ස්වරූපයේ සමතාවන් අධ්‍යයනයේ දී එච්.සී.පී. බෙල් පුරාවිද්‍යා කොමසාරිස්ගේ පාලන වාර්තාවල දක්වා ඇති තොරතුරු වැදගත් වේ. 1893 පුරාවිද්‍යා පාලන වාර්තාවේ දක්වා ඇති තොරතුරු අනුව ජේතවන විහාරයේ මෙම විශේෂ ගොඩනැගිල්ල ප්‍රධාන පිරිවෙනක් බැව් සඳහන් කර ඇත. අඩි 57×45 ප්‍රමාණයේ සහ ගල් කණු 20කින් සමන්විත මෙම මණ්ඩපය, පියගැටපෙළ, ද්වාර මණ්ඩපය, යට මාලයේ ලක්ෂණ, කුළුණු මහා විහාර මයුර පිරිවෙනට සමානකමක් දැකිය හැකි බව ඔහු මුල් වරට පෙන්වා දී තිබේ (ASCAR 1893:3).

එච්.සී.පී බෙල් විසින් මෙම ගොඩනැගිලි දෙකෙහි අලංකරණ අංගවල පවත්නා විශේෂත්වයේ සම්බන්ධය හඳුනාගෙන වාර්තාගතකරණය සිදුකර තිබීම නිසා මෙම ගොඩනැගිලිවල පුරාණ උපයෝගීතාවන් විමර්ශනයට වඩා පහසු වේ. මහාවංස විස්තර වලට අනුව මහා විහාර මයුර පිරිවෙනෙහි ස්ථවිර ස්වාමීන් වහන්සේ නමක් වූ සංඝපාල තෙරුන් වැඩ වාසය කළ බව සඳහන් වන අතර උන්වහන්සේ බැහැ දැකීමට ඉන්දියාවේ සිට බුද්ධඝෝෂ හිමි වැඩම කළ බව ද සඳහන් වී තිබේ (මව. xxxvii:232). විවිධ රජවරුන්ගේ කාල පරිච්ඡේදයන්හි දී රාජ්‍යය අනුග්‍රහය ලබමින් අඛණ්ඩ ප්‍රතිසංස්කරණයන්ට භාජනය වෙමින් පැමිණ ඇති මහා විහාර මයුර පිරිවෙන තුළ ප්‍රධාන සංඝනායක භික්ෂුවක් වාසය කළේ නම් ඒ ලක්ෂණ හා ඥාති සබඳකම් පිළිබිඹු කරන්නා වූ ජේතවන මොනර මාළිගය එහි ස්ථානගතවීමේ ස්වභාවය අනුව එහි ද විශේෂ සංඝනායක හිමිනමක් වැඩ වාසය කළ බවට උපකල්පනය කළ හැකිවන්නේ පූජනීය අංගනයට මදක් බැහැරට වන්නට ආවාසයක තිබිය යුතු සියලු ගොඩනැගිලි අංගවලින් සමන්විත සංකීර්ණයක එය පිහිටා ඇති බැවිනි. මෙම ස්මාරකය පිහිටි සංකීර්ණය තුළ අලංකාර වැසිකිලි හා කැසිකලි පද්ධතියක්, පොකුණක් සහ තවත් ගොඩනැගිලි කිහිපයක් ද වේ. භික්ෂූන් වහන්සේලාගේ සේනාසන පිළිබඳව විස්තර කරන රාහුල හිමි සේනාසන පිහිටි ගොඩනැගිලි අතර භාවනා ගෘහය වැදගත් වන බව දක්වා ඇත (1989:138). බොහෝ විට මුළ දී මෙය ආරාමයේම පිහිටි ගෘහයක් වූ අතර

පධානඝර නමින් හැඳින්වෙන්නේ මුල් කාලීනව පැවති එම ගෘහය බව උන්වහන්සේ පෙන්වා දී ඇත (එම). වැඩි දුරටත් අදහස් දක්වන උන් වහන්සේ පසු කාලීනව පධානඝරය, ආරාමයේ නායක භික්ෂුවගේ ලැගුම්ගෙය වන්නට ඇති බව දක්වා තිබේ. එසේ උපකල්පනය කිරීමට සාධක ලෙස බුද්ධඝෝචාර්යයයෝ මහා විහාරයේ මහා පධානඝරයේ දී සංඝපාල නායක ස්ථවිරයන් බැහැදුටුවා යැයි පවසන කරුණ පාදක කර ගෙන ඇත (*මව.* xxxvii:23; රාහුල 1989:138). මේ ආකාරයට රාහුල හිමි දක්වන අදහස අනුව මහා විහාරවල පැවති භාවනාගෘහය පධානඝරයේ මූලාරම්භය දක්වන ස්ථානය වූ බව පැහැදිලිවන අතර පසු ව ක්‍රිස්තු වර්ෂ 5 වැනි සියවසේ දී පමණ පධානඝර ලෙස වෙන ම විහාර සැලසුම් ආර අනුරාධපුරයේ ආරම්භ වීම සිදු වී ඇති බව ද පෙන්වාදිය හැකි ය. එසේ උපකල්පනය කිරීමට ඇති සාධක ලෙස මහා විහාරයේ පැවති පධානඝරයේ සාධක දැකගත හැකිවීම මෙන් ම අභයගිරි විහාරය ඇසුරින් පැවති සුදස්සන පධානඝර පිළිබඳ ව මූලාශ්‍රයගත කරුණු ද ගෙන හැර දැක්විය හැකි ය. V වැනි කාශ්‍යප රජුගේ පුවරු ලිපියක අභයගිරි විහාරයේ එකල පැවති විශේෂ ස්ථාන පිළිබඳ ව දැක්වෙන සඳහනට අනුව, *දාගැබිහි ඉසා.. බත්ගෙයි ඉසා, මහබෝගෙයි ඉසා, පියන්ගල්වෙහෙර ඉසා....* (Ez. Vol. I:41-57) ලෙස දැක්වේ. අභයගිරි විහාරයේ රත්නප්‍රාසාදයට වයඹ දෙසින් දීඝපාෂාණ පර්වත වැටියේ කටාර කෙටූ ගල් ලෙනක පැවති පධානඝරයක් ගවේෂණයක දී සොයාගෙන ඇත (කුලතුංග 2012:144). ක්‍රිස්තු වර්ෂ 2 වැනි සියවසේ වසභ රජුට අයත්ලිපියක එහි වූ ආරාමය සුදසන නම් පධානඝරය ලෙස දක්වා ඇත (Ez vol. i:64). මෙම පධානඝරය වළගම්බා රජුගේ පියා වූ සද්ධාතිස්ස රජුගේ කාලයේ දී ද සඳහන්වන බැවින් අභයගිරි විහාරය සෑදීමට පෙර ආරම්භ වී පසුකාලීන ව විහාරයේ සංවර්ධන අවස්ථාවන්හි දී වැඩි දියුණු වන්නට ඇති බව කුලතුංගයන් ගේ මතයයි (2012:144). විවිධ විද්වතුන් විසින් සිදුකරන ලද පර්යේෂණ තුළින් ඉදිරිපත් කර ඇති තර්කයන් විමර්ශනාත්මක ව සලකා බලන විට පුරාණ කාලයේ දී පධානඝරය විශාල ආරාමයක අත්‍යවශ්‍ය අංගයක් ලෙස තිබී ඇති බව පෙනේ. මෙම මතය තහවුරු වන ආකාරයට ජේතවන භූමියෙන් හමු වී ඇති සෙල්ලිපියක් මගින් ද පුරාණයේ දී ජේතවනාරාමයේ පැවති පධානඝරයක් පිළිබඳ තොරතුරු හඳුනාගැනීමට හැකියාව ඇත. ජේතවන විහාරයේ මෑතක දී සිදුකළ පුරාවිද්‍යාත්මක කැණීමකින් ජේතවන ස්තූප සලපතර මළුවේ තිබී හමු වූ සෙල්ලිපියක ජේතවන විහාරයේවූ පධානඝරයක් ගැන විස්තර වේ. එම සෙල්ලිපිය වර්තමානයේ ජේතවන කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනය කර ඇති අතර එහි දැක්වෙන පෙළ මෙසේය.

**හුගිලිවසන ශිවයහ නගවෙරෙ බුදල්හ**

**වෙනජනඅප දෙජන (මො) (දෙනාන)ක ථුවය**

(බද) වනහි පතනගලහි බිකුසඟ (හිමියන්ට) එක සියෙක කහවණ දිනමහ මහ පලසව (සතනට) . . . . .

මෙම සෙල්ලිපියේ සඳහන් වන අක්ෂර අනුව එය ක්‍රිස්තු වර්ෂ 5-7 සියවස් අතර කාලයට අයත්වන අතර ඉන් කියවෙනුයේ නාග විහාරයේ සිට පැමිණි බුදල් සහ හුගලි ප්‍රදේශයේ සිට පැමිණි ශිව යන වෙළඳ දෙබෑයන් දෙදෙනා කහාපණ එකසියෙක මුදල් වියදම් කර දෙනානක (ජේතවන විහාරයේ) පධානඝරයේ වසන භික්ෂු සංඝයාගේ සිව්පස සලසන ලද බවය (පෙළ කියවීම, පියතිස්ස සේනානායක 2015). රාහුල හිමි පෙන්වා දී ඇති ආකාරයට පධාඝරයෙහි මූලාරම්භය මහා විහාරායන්හි පැවති භාවනා ගෘහයෙන් ආරම්භ වූයේ නම් යථෝක්ත ව දක්වන ලද ජේතවන භූමියෙන් ලැබී ඇති සෙල්ලිපියේ සඳහන්වන පධානඝරය පිළිබඳව විමසා බැලීම වැදගත් වේ. ජේතවනාරාමය තුළ 1980 සිට 2012 දක්වා කාලය තුළ සිදුකළ කිසිදු කැණීමකින් එහි පැවති පධානඝර ගොඩනැගිල්ලක සාධක හඳුනාගත නොහැකි විය. ජේතවනාරාමය අශ්‍රිත ව දැකගත හැකි පධානඝරයකට සමාන පුරාණ ඉදිකිරීමක් ලෙස හඳුනාගත හැකි වූයේ වත්මනෙහි 2013 වසරේ කැණීම් සිදුකර පාදා සංරක්ෂණය කළ සම්පූර්ණ කුළුණු හිස් සහිත ව දැකගත හැකි මොනර මාලිගය නමින් ව්‍යවහාරවන ගොඩනැගිල්ලයි. මෙහි දැකගත හැකි බොහෝ වාස්තුවිද්‍යා ලක්ෂණ පධානඝරයකට සමාන වන බැවින් පුරාණයේ මෙම ගොඩනැගිල්ල පධානඝරයක් ව පැවති බවට සාක්ෂි තිබේ. ගොඩනැගිල්ලේ ප්‍රධාන දොරටුවෙන් ප්‍රවේශවන විට එහි දකුණු පැත්තේ ඇති විශාල ගල් ආසනය බටහිරාරාම පධානඝර විහාරයේ ඇති ගල් ආසනයට සමාන වේ. එම ආසනය මගින් වර්ධිත අවස්ථාවේ පධානඝර ලක්ෂණ සිහි ගන්වයි. මහා විහාර මයුර පිරිවෙන හා සමාන ලෙසට ම කුළුණුවල හා ගොඩනැගිල්ලේ භෞතික ස්වරූපයේ ලක්ෂණ බොහෝ දුරට සමානත්වයක් ද පෙන්නුම් කෙරේ. මේ ආකාරයට මහාවිහාර මයුර පිරිවෙන හා ජේතවන මොනර මාලිගය අතර භෞතික ලක්ෂණ වල සමානතාව හා පුරාවිද්‍යා සාධක වන සෙල්ලිපි සාධක ද සලකා බැලූ විට ජේතවන විහාරයේ ද මුල් කාලීනව පධානඝරයක් පැවති බව උපකල්පනය කළ හැකි ය. ඒ අනුව මහාවිහාර ආශ්‍රිත ව පධානඝරවල මූලාරම්භය සිදු වූවා යැයි රාහුල හිමි දක්වන තර්කයට එකඟ විය හැකි බව මෙම පුරාවිද්‍යා සාධක අනුව පෙන්වාදිය හැකි ය. ඒ අනුව එකල භාවනා ගෘහය නම් වූ විශේෂ ගෘහය තුළ විශේෂ ස්ථවිර නමක් වැඩවාසය කළනිසා එම විශේෂත්වය නිසාම ආරාමය තුළ අලංකාර ගොඩනැගිල්ලක් ලෙස මයුර පිරිවෙන හා මොනර මාලිගය ඉදිවීම සිදු වී ඇති බව පෙන්වාදිය හැකි අතර එමගින් මහා විහාරයේ පැවති පධානඝර පිළිබඳ ව හඳුනාගැනීමට හැකිවේ.

## නිගමනය

යථෝක්ත පර්යේෂණය තුළින් සාකච්ඡාවට භාජනය කළ මහා විහාර මයුර පිරිවෙන හා ජේතවන මොනර මාළිගය යන ගොඩනැගිලි දෙක පිළිබඳ ව විමර්ශනය කිරීමේ දී එහි වාස්තුවිද්‍යා සැලැස්මෙහි සමානකමක් දැකිය හැකි බව පෙන්වාදිය හැකි ය. පුරාණයේ එම ගොඩනැගිල්ල හැඳින්වීමට "මයුර පිරිවෙන" යන නාමය භාවිත කර තිබීමෙන් ඒ සඳහා විශේෂත්වයක් ලබාදීමට කටයුතු කර තිබේ. ජේතවනයේ මොනර මාළිගය නමින් ව්‍යවහර කරන ගොඩනැගිල්ලට ද එම නම ලැබී ඇත්තේ එහි අලංකාර ස්භාවය හා වාස්තුවිද්‍යා සැලැස්මේ සමානත්වය මෙන්ම භාවිත උපයෝගිතාව අනුවය. ඒ අනුව මහා විහාර ආශ්‍රිත ව පධානඝර පැවති බව රාහුල හිමි පවසන තර්කය සාධාරණ බව ජේතවන ස්තූප භූමිය තුළින් ලැබී ඇති සෙල්ලිපිය තුළින් ද පැහැදිලි වේ. ජේතවන භූමියේ ඇති වර්තමානයේ මොනර මාළිගය නමින් හැඳින්වෙන පුරාණ ගොඩනැගිල්ල අතීතයේ දී පධානඝරයක් ලෙස භාවිත කර ඇති ගොඩනැගිල්ල බව පෙන්වාදිය හැකි අතර පධානඝරවල මූලාරම්භය මහා විහාර ආශ්‍රිතව සිදු වී ඇති බව මෙම පර්යේෂණය අනුව පෙන්වාදිය හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි නාමාවලිය


කුලතුංග, ටී. ජී. (2012), *අනුරාධපුර මහා විහාර තුළ වූ පධානඝර*, 143-147

*Anceint Ceylon,* No.23, Archaeology Survey Department, Colombo.

කෞෂල්‍යය, ඉනෝජ් හා කරුණාසේන හෙට්ටිආරච්චි (2012), පධානඝරවල නීතිය හෙළිකරන තිරියායේ අප්‍රකට සෙල්ලිපියක් 80 - 90, *පුන්කලස*, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

ගුණරත්න, ශ්‍යාමලී (2015), *අප්‍රකාශිත විද්‍යාත්මක වාර්තාව*, මැයි මාසය, ජේතවන පර්යේෂණ අංශය, ජේතවන ව්‍යාපෘතිය.

නානායක්කාර, ගුණවර්ධන (1988), සංස්. *නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය*, සීමාසහිත ඇම් ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

මද්දුමගේ, මිල්ටන් (1987), *කලා ඉතිහාස විචාරය,* චතුර මුද්‍රණ ශිල්පියෝ, වැල්ලම්පිටිය.

*මහාබෝධිවංස ග්‍රන්ථිපදය* (1985), සංස්. ගතාරේ ධම්මපාල, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ.

*මහාවංසය* (1912), දොන් අන්ද්‍රස් ද සිල්වා බටුවන්තුඩාවේ, සීමාසහිත දීපානි මුද්‍රණාලය, ගංගොඩවිල.

රාහුල හිමි වල්පොල (1989), *ලක්දිව බුදුසමයේ ඉතිහාසය*, සීමාසහිත එම්.ඩී. ගුණසේන සහ සමාගම.

වික්‍රමගමගේ, චන්ද්‍රා (1995), *ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු*, ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය, කොළඹ.

විජේරත්න, බී. එස්. (1951), *ලංකා චිත්‍රකලා ඉතිහාසය,* සීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම, කොළඹ.

සිරිනිමල් ලක්දුසිංහ (1998), කැටයම් කලාව 384-400 *අපේ සංස්කෘතික උරුමය, 2 කාණ්ඩය,* සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

සේනානායක, පියතිස්ස (2015), *අප්‍රකාශිත කෞතුකාගාර සෙල්ලිපිය,* පෙළ කියවීම ජේතවන ව්‍යාපෘතිය.

සෝරත, ඩබ්. (1999), *ශ්‍රීසුමංගල ශබ්දකෝෂය,* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන පාර, කොළඹ.

Bell H.C.P. (1894), *Archaeology Survey of Ceylon,* Annual Report, Government printer, Ceylon.

Wicramasingha, D.M.D.Z. (1912), *Epigraphia Zeylanica vol. i,* Archaeology Survey Department, Colombo.

Wicramasingha, D.M.D.Z. (1928-1933), *Epigraphia Zeylanica vol.III,* Archaeology Survey Department, Colombo.